ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය : පැය 01 යි. |
|---|---|---|

සැලකිය යුතුයි.
I. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිවේ.
II. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ක්ලෝඩියස් ටොලමි ජීවත් වූ ප්‍රදේශය කුමක්දැයි මින් තෝරන්න.

1. ග්‍රීසිය 2. රෝමය 3. ඇලෙක්සැන්ඩ්‍රියාව 4. ඉතාලිය

02. ගල් තලාවල හෝ ගල් කුළුමත ලියූ ලිපි හඳුන්වන්නේ මින් කුමන නමකින් ද?

1. ගිරිලිපි 2. ටැම් ලිපි 3. පුවරු ලිපි 4. ආසන ලිපි

03. පහත සඳහන් පිළිතුරු අතරින් අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කරන ජීවමාන සාක්ෂි පමණක් ඇතුළ
පිළිතුර මින් තෝරන්න.

1. කැටයම්, මූර්ති, සෙල්ලිපි
2. වල්ලිපුරම් රන් සන්නස, ගොං කුරය, ඇත් අඩිය
3. සීගිරි චිත්‍ර, පනාකඩුව තඹ සන්නස, හක් ගෙඩිය
4. පැරණි චිත්‍ර, මූර්ති, කැටයම්

04. පහත සඳහන් ස්ථාන අතරින් ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ තෙත් කලාපයට අයත් ස්ථානයක් ස
පහත රට වියළි කලාපයට අයත් ස්ථානයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - අලුලෙන B - පාහියන්ගල ලෙන
C - රාවණා ඇල්ල ලෙන D - පොතාන

1. A, B 2. B, D 3. A, C 4. C, D

05. අයිස් යුගය අවසන් වීමත්, ලෝකය උණුසුම් වීමත් මගින් කෘෂිකර්මය සඳහා වඩාත් සුදුසු පරිසර තත්ත්වය
ගොඩනැගීමට බලපෑ යුගය මින් කුමක් ද?

1. ප්ලයිස්ටොසීන යුගය
2. පුරාසික යුගය
3. හොලෝසින යුගය
4. පුරා ශිලා යුගය

06. පහත I තීරුව හා II තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර මින් තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| A - ගෘහපතීන් | D - කණ්ඩලම සෙල්ලිපිය |
| B - ගමිකයින් | E - පෙරියපුලියන්කුලම සෙල්ලිපිය |
| C- පරුමකවරු | F - ජාතකට්ඨ කතාව |

1. DFE 2. EFD 3. FDE 4. DEF

07. කොතුරුගැනා හා පන අදෙක ලෙස පැරණි සෙල්ලිපිවල සඳහන් රාජ්‍ය නිලධාරීන් හඳුන්වන නාම
පිළිවෙලින් දැක්වෙන පිළිතුර මින් තෝරන්න.

1. වත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරී / වෙළෙඳ ප්‍රධානී
2. නගරයේ වාස්තු ශිල්පියා/ වෙළෙඳ කටයුතු භාර ප්‍රධානී
3. ඇත් අංශයේ ප්‍රධානියා/ කාසි අච්චුගැසීමේ ප්‍රධානියා
4. රාජ්‍ය ලේඛණාගාර ප්‍රධානී/ නාට්‍ය අංශයේ ප්‍රධානී



CamScanner

08. මෙරට භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමට චෝල ආක්‍රමණිකයින් පරාජය කළ රජතුමා මින් කවරෙක් ද?

1. මහා පරාක්‍රමබාහු රජතුමා
2. දුටුගැමුණු රජතුමා
3. වළගම්බා රජතුමා
4. පළමුවන විජයබාහු රජතුමා

09. ක්‍රි.ව. නවවන සියවසේ "වදාළ සභ සභාව" යන නීතිමය ආයතන පිළිබඳ වඩාත් වැදගත් සෙල්ලිපි හමුවන්නේ මින් කවර රජ පෙළපත මගින් ද?

1. මෞර්ය
2. කාලිංග
3. මානවම්ම පරම්පරාව
4. පාණ්ඩ්‍ය පරම්පරාව

10. සත්ත්වපාලනය මෙරට කරගෙන ගිය බවට දැක්වෙන ගෘහණියක් එළදෙණකගෙන් කිරි දෝවනය කරන ආකාරය පෙන්වන කඳිම කැටයමක් දක්නට ලැබෙන්නේ මින් කුමන ස්ථානයේ ද?

1. මිහින්තලා පුවරු ලිපියෙහි
2. ජේතවනාරාමය අසල
3. සීගිරියේ නාගපබ්බත විහාරයෙහි
4. ඇම්බැක්ක දේවාලයෙහි කැටයම්වල

11. යමෙක් රූපයෙන්, යෞවන ගුණයෙන් හා ඥානයෙන් යුක්ත වුවත් ඔහු හෝ ඇය යම් ශිල්ප ශාස්ත්‍රයක් නොදන්නේ නම් සුවඳ නොමැති කැළ මලකට සමාන බව දැක්වෙන ග්‍රන්ථය මින් කුමක් ද?

1. ජාතකට්ඨකතාව
2. සද්ධර්මාලංකාරය
3. සද්ධර්මරත්නාවලිය
4. ලෝකෝපකාරය

12. යම් කිසි වස්තුවක් පොළොවට ලම්බාකාර වීමෙන් එම වස්තුව මඟින් පොළොව මත ඇති කරන පීඩනය නිෂ්ක්‍රියවන බවට යොදා ගත හැකි හොඳම උදාහරණය වන්නේ මින් කුමක් ද?

1. උඩරංචාමඩම නිවාසය
2. රුවන්වැලිසෑයෙහි අත්තිවාරම
3. වජ්‍රවුම්බටය
4. මහකනදරා ගල් පාලම

13. වගාවලට ඇතිවන කෘමි උවදුරු වලක්වා ගැනීම හා හරකුන්ට වැළදෙන ඇතැම් රෝග නිවාරණය කිරීමට අ පැරැණ්නන් අනුගමනය කළ ක්‍රමවේදය මින් කුමක් ද?

1. කිරිමඩු ශාන්තිකර්මය
2. කෙම්පහන් ක්‍රමය
3. යාතු කර්ම පැවැත්වීම
4. දෙවියන්ට පුද පූජා පැවැත්වීම

- පහත සඳහන් වගුව ඇසුරින් 14 හා 15 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නීතිය | රජතුමා | සෙල්ලිපිය |
|---|---|---|
| A - නිසි කලට සීසෑම් නොකරණ පුද්ගලයන්ට කළං පහක දඩයක් නියම කිරීම | D - හතරවන මිහිඳු රජු | G - සිතුල්පවුව සෙල්ලිපිය |
| B - උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බව | E - පළමුවන ගජබාහු රජු | H - කොණ්ඩවට්ටවාන් වැව් [illegible] |
| C - වැරදි කළ වුන්ට දඬුවම් කිරීමට මහාධිකරණයක් තිබූ බව | F - පස්වන කාශ්‍යප රජු | I - අනුරාධපුර පුවරු ලිපිය |

14. ඉහත සඳහන් තොරතුරු අනුව පැරණි ලංකාවේ කෘෂිකර්මාන්තය මැනවින් පවත්වාගෙන යාමට ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමට පාලකයන් විසින් ගත් නීතිය හා සම්බන්ධ නිවැරදි පිළිතුර මින් කුමක් ද ?

1. BDH
2. CDI
3. AFH
4. BFG

15. ඉහත තොරතුරු ඇසුරින් පාරිසරිකව ඇතිවන ස්වභාවික විපත් වළකා ගැනීමට අනුගමනය කර ඇති ක්‍රියා ඇතුළත් නිවැරදි පිළිතුර මින් කුමක් ද?

1. CEI
2. BDI
3. AEH
4. CDH

16. ශ්‍රී ලංකාවේ පැරණි නගර පරිහානියට බලපෑ හේතු අතර සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

1. මධ්‍යගත පාලනය ස්ථාවර වීම
2. සතුරු ආක්‍රමණවල බලපෑම
3. ආරක්ෂාව නොමැති වීම
4. ආරක්ෂාව සහිත ප්‍රදේශවලට ජනතාව සංක්‍රමණය



CamScanner

17. පහත I තීරුව හා II තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර මින් තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| A - හතරවන භුවනෙකබාහු රජු | E - කෝට්ටෙ |
| B - පළමුවන භුවනෙකබාහු රජු | F - ගම්පොළ |
| C - හයවන භුවනෙකබාහු රජු | G - කුරුණෑගල |
| D - දෙවන භුවනෙකබාහු රජු | H - යාපහුව |

1. FHEG 2. EGHF 3. HGEF 4. GHEF

18. මහනුවර රාජධානි සමයේ රජුගේ සෘජු පාලනය යටතේ පැවති පරිපාලන ආයතනය වන්නේ මින් කුමක් ද?

1. රටවසම 2. බද්දේ සංවිධාන 3. ප්‍රදේශීය පාලනය 4. මහවාසල සේවය

19. උඩරට රාජ්‍යයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් වෙන් වූ කෘෂිකාර්මික අර්ථ රටාව අයත් වන්නේ,

1. වී ගොවිතැනට ය 2. හේන් වගාවට ය
3. ගෙවතු වගාවට ය 4. සත්ත්ව පාලනයට ය

20. මධ්‍යතන යුගයේ යුරෝපා රටවල භාවිත වූ ප්‍රධාන භාෂාව වන්නේ මින් කුමක් ද?

1. ලතින් භාෂාව 2. ග්‍රීක භාෂාව 3. ගෝත්‍රික භාෂාවන් 4. රෝම භාෂාව

- පහත සඳහන් තොරතුරු ඇසුරින් 21, 22 හා 23 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ධර්මපාල රජු අනුප්‍රාප්තිකයෙකු නොතබාම මිය යාම.
B - උඩරට මෙන් ස්වභාවික ආරක්ෂාවක් නොමැති වීම.
C - නිරන්තර යුද්ධවලට පැටලීම.
D - රජු තෑගි ඔප්පුවක් මඟින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරීම.
E - ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොමැති වීම.
F - අවසන් කාලයේ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

21. ඉහත සඳහන් කරුණු අතරින් කෝට්ටේ රාජධානිය පිරිහීම හා සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?

1. B, C 2. D, F 3. C, F 4. A, D

22. සීතාවක රාජධානිය බිඳවැටීමට පමණක් අදාළ පිළිතුර මින් කුමක් ද?

1. B, E 2. A, D 3. C, F 4. C, E

23. යාපන රාධානිය බිඳවැටීමට පමණක් අදාළ පිළිතුර මින් කුමක් ද?

1. C, E 2. B, E 3.D, F 4. A, D

24. කාර්මික විප්ලවය සමයේ අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය සහ නිෂ්පාදන ද්‍රව්‍ය බෙදා හරින ලද ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මින් කුමන නගරය ද?

1. ලන්ඩන් 2. ලැන්කැෂයර් 3. යෝක්ෂයර් 4. දකුණු වේල්සය

25. බ්‍රිතාන්‍ය සමයේ ශ්‍රී ලංකාවේ මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීමේ දී මූලිකත්වය ගත් ආණ්ඩුකාරවරුන් පිළිවෙළින් ඇතුලත් පිළිතුර මින් කුමක් ද?

1. එඩ්වඩ් බාන්ස්/ හෙන්රිවෝඩ් ආණ්ඩුකාරවරු 2. ෆෙඩ්රික් නෝර්ත්/මැකලම් ආණ්ඩුකාරවරු
3. ටොරින්ටන්/ තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරු 4. රොබට් බ්‍රවුන්රිග්/ රිජ්වේ ආණ්ඩුකාරවරු

26. ඉංග්‍රීසීන් මදුරාසි පාලනය යටතේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කළ නිලධාරියා මින් කවරෙක් ද?

1. කලෙක්ටර්වරු 2. රෙසිඩන්ට්වරයකු
3. ආණ්ඩුකාරවරයෙකු 4. අවුම්ල්දාර්වරු



CamScanner

27. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මනුෂ්‍යත්වයේ සීමා ඉක්මවා කටයුතු කළ නිසා මහජන විරෝධී බලපෑම් ඇතිවීමට බලපෑ ප්‍රධාන කරුණක් වන්නේ මින් කුමක් ද?

1. ඇහැලේපොළ නිලමේතුමා අත්අඩංගුවට ගැනීම.
2. මහනුවරට පැමිණි ජනතාවට රාත්‍රී කාලයේ නවාතැන් නොදීම.
3. ඇහැලේපොළ කුමාරිහාමි හා දරුවන් අමානුෂික ලෙස ඝාතනය.
4. ජනතාව හා රජු අතර ගැටුම් ඇති වීම.

28. පහත I තීරුව හා II තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර මින් තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| A - අනගාරික ධර්මපාල තුමා | E - මුස්ලිම් නෙයිසන් පුවත්පත |
| B - පියදාස සිරිසේන මහතා | F - සිංහල බෞද්ධයා පුවත්පත |
| C- ආරුමුග නාවලර්තුමා | G - සිංහල ජාතිය |
| D - සිද්දි ලෙබ්බෙ මහතා | H - උදයභානු |

1. HFGE  2. EGFH  3. EGEF  4. FGHE

29. මෙරට බෞද්ධ පුනරුද සමයේ ගිහි පැවිදි දෙපක්ෂය එකම වේදිකාවකට කැඳවන පොදු සංවිධානය වන්නේ මින් කුමක්ද?

1. අමද්‍යප ව්‍යාපාරය
2. ජාතික සංගමය
3. පරම විඥානාර්ථ සමාගම
4. ලංකා ජාතික සංගමය

30. 1833 වර්ෂයේ පිහිට වූ ව්‍යවස්ථාදායක සභාවේ තීරණ පිළිගැනීමට ආණ්ඩුකාරවරයා බැඳී නොසිටියමුත්, ව්‍යවස්ථාදායක සභාවේ උපදෙස් නොපිළිගන්නා විට, ආණ්ඩුකාරවරයා අනුමැතිය ලබා ගත යුත්තේ මින් කුමන පුද්ගලයෙකුගෙන් ද?

1. ගණකාධිකාවරයාගෙන්
2. යටත් විජිතභාර ලේකම්ගෙන්
3. භාණ්ඩාගාරිකගෙන්
4. කොළඹ රේගු අයකැමිගෙන්

31. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගිය උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් බවට ..න්වූයේ,

1. අමද්‍යප ව්‍යාපාරය යි.
2. නිදහස් අධ්‍යාපන ව්‍යාපාරය යි.
3. පොපිමල් ව්‍යාපාරය යි.
4. සූරියමල් ව්‍යාපාරය යි.

32. බ්‍රිතාන්‍ය සමයේ දී මෙරට පරිපාලනමය වශයෙන් උරුම වූ ප්‍රයෝජනවත් අංගයක් වන්නේ මින් කුමක් ද?

1. අපනයන වැවිලි භෝග හඳුන්වා දීම.
2. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
3. මධ්‍යම පන්තියක් බිහි වීම.
4. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය.

33. මෙරට ධනවාදී ආර්ථික ක්‍රමයකට පසුබිම සැකසෙන්නේ මින් කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ද?

1. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංසකරණ
2. කෝල්බෲක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
3. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංසකරණ
4. කෲෘව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

34. මිනිස් මූලික අයිතිවාසිකම් කඩවී ඇත්නම් ඒ පිළිබඳ පරීක්ෂා කොට සුදුසු තීරණවලට එළඹෙන්නේ මින් කුමන අධිකරණය මගින් ද?

1. මහාධිකරණය
2. අභියාචනාධිකරණය
3. ශ්‍රේෂ්ඨාධිකරණය
4. මහේස්ත්‍රාත් අධිකරණය

- පහත දක්වා ඇති ප්‍රකාශ ඇසුරින් 35 – 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. බැස්ටීල් බන්ධනාගාරය
2. ලියෝන් ට්‍රොස්කි

B - 1. ආගමික ගැටුම්
2. ඇමරිකන් ජනපද පිටුවීම

C - 1. පන්ති රහිත සමාජය
2. ධනවාදී අර්ථක්‍රමය

D - 1. මධ්‍ය පාලනය බිඳ වැටීම
2. ලෆායෙට්



CamScanner

35. මින් පළමු වැන්නේ හේතුවෙන් දෙවැන්න බිහිවීම දැක්වෙන පද යුගලය මින් කුමක් ද?

1. B　　2. A　　3. C　　4. D

36. මෙහි පළමුවැන්නේ බලය බිඳ වැටීමනිසා දෙවැන්නේ බලය තහවුරු වීම දැක්වෙන පද යුගලය මින් කුමක් ද?

1. B　　2. A　　3. D　　4. C

37. මෙහි කිසිම සම්බන්ධතාවයක් නොදක්වන පද යුගලය මින් කුමක්ද?

1. A　　2. D　　3. B　　4. C

38. දෙවැන්න බිඳ වැටීම නිසා පළමුවැන්න බිහිවීමක් දක්නට ලැබෙන පද යුගලය මින් කුමක් ද?

1. D　　2. C　　3. B　　4. A

- **පහත A හා B ප්‍රකාශ කියවා 39 – 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - විටෝරියෝ ඕලැන්ඩෝ　　B - ජෝන් මාෂල්

39. ඉහත ප්‍රකාශ අතුරින් පළමුවන ලෝක යුධ සමයේ රහස් ගිවිසුමක් මඟින් මිත්‍ර පිළට එකතු වී ජර්මනියට විරුද්ධව යුධ ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන්,

1. B නිවැරදිය A වැරදිය　　2. A හා B දෙකම නිවැරදිය
3. A හා B දෙකම වැරදිය　　4. A නිවැරදිය B වැරදිය

40. ඉහත තොරතුරු අනුව දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීම සම්බන්ධයෙන්,

1. B වැරදිය A නිවැරදිය　　2. A හා B දෙකම නිවැරදිය
3. A වැරදිය B නිවැරදිය　　4. A හා B දෙකම වැරදිය

(ලකුණු 2 x 40 = 80)



CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය: පැය 03 යි. |
|---|---|---|

සැලකිය යුතුයි,
- 1 කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- 11 කොටසින් ප්‍රශ්න හතරකට ද 111 කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
- අමතර කියවීම් කාලය විනාඩි දහයකි.

## 1කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කනගරායන් ආරු, පල්ලවංක, හැමන්හෙයිල්, කල්පිටිය, යාපහුව, පිදුරංගල, සෙංකඩගල, කෝට්ටේ, මාදුරු ඔය ජලාශය, වළවේ ගඟ, තොටලුතොට, හුරුළු වැව (ල.12)

(ii) පැරිසිය, ජිනෝවා, පර්සියන් බොක්ක, කුණාටු තුඩුව, චෙන්නායි, කොරියානු අර්ධද්වීපය (ල. 6)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - පළමුවන විජයබාහු රජු විසින් පනාකඩුව තඹ සන්නසෙහි ඇගයීමට ලක්කළ පුද්ගලයා නම් කරන්න.


B - ශ්‍රී ලංකාව රතුකැට දිවයින නමින් හැඳින් වූ අරාබි ජාතික ඉතිහාසඥයා නම් කරන්න.

C - සිංහල නායකයින් හා එකතු වී දේශපාලන බලතල ලාංකිකයන්ට ලබා ගැනීමටත්, 1919 වර්ෂයේ දී ලංකා ජාතික සංගමය පිහිටු වීමටත්, නායකත්වය ගත් දෙමළ ජාතික නායකයා කවුරුන් ද?

D - ඇමරිකන් ජනපදවලින් අය කළ යුතු තීරු බදු ක්‍රමානුකූලව අය කර ගැනීමට කටයුතු කළ බ්‍රිතාන්‍ය අගමැති කවුරුන් ද? (ල. 4)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනයකොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



1. මෙහි දැක්වෙන සුසාන වර්ගය නම් කරන්න.
2. මෙය අයත් යුගය නම් කරන්න.
3. මෙය නිර්මාණය කිරීමට යොදාගත් අමුද්‍රව්‍ය නම් කරන්න.
4. මෙම ස්ථානය භාවිත කර ඇති පුද්ගලයින් කවුරුන් ද?

(ල. 4)

B



1. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. ඔහු අයත් රට නම් කරන්න.
3. ඔහු කුමන විප්ලවයක් හා සම්බන්ධවේ ද?
4. මොහු ඉදිරිපත් කළ ලෝක ව්‍යාප්ත වූ දර්ශනය නම් කරන්න.

(ල. 4)



CamScanner

## 11 කොටස

2. i. A - ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි දෙක නම් කරන්න. (ල. 2)

B - ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයේ පොළොවෙන් මැටි සහිත වැලි පසකින් වැසුණු බොරළු තට්ටුව පුරාවිද්‍යාඥයින් හඳුන්වන්නේ කුමන නමකින් ද? (ල. 1)

ii. පහත A සිට D තෙක් ඇති ඓතිහාසික වැදගත් කමකින් යුත් වචනවල අර්ථය පිළිවෙළින් සඳහන් කරන්න.

A - අවරණ B - නුරුපුර

C - පරික්ඛිත ගම D - නකර (ල. 4)

iii. පූර්ව ඓතිහාසික යුගයේ උඩරංවාමඩම කැණීමෙන් එකළ ක්‍රමවත් කෘෂිකාර්මික රටාවක් හා මැටි තාක්ෂණයක් තිබූ බවට හමුවන තොරතුරු වෙන් වෙන්ව ගෙන උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 5)

iV. ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාව තුළ සරු වෙළෙඳාමක් පැවති බව කරුණු තුනක් මඟින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

3. i. ජල කළමනාකරණයේ දී පැරැණ්නන් විසින් අනුගමනය කරන ලද උපක්‍රම තුනක් සඳහන් කරන්න. (ල. 3)

ii. පහත සඳහන් වැව් හා සම්බන්ධ ඇළ මාර්ග වරහන් තුළින් තෝරා පිළිවෙළින් සඳහන් කරන්න.

A - මින්නේරිය වැව B - තිසා වැව

C - පරාක්‍රම සමුද්‍රය D - රාජාංගනය වැව

(අංගමැඩිල්ල ඇළ/ ඇළහැර ඇළ/ යෝධ ඇළ/ තල්වතු ඇළ/ රිදී බැදි ඇළ/ මිණිපේ ඇළ) (ල. 4)

iii. මෙරට පැරණි ඉංජිනේරුවරුන්ගේ තිබූ වාස්තු විද්‍යාත්මක දැනුම රුවන්වැලිසෑය ඉදිකිරීමේ දී ප්‍රායෝගිකව යොදාගත් ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)

iV. පැරණි සමාජය යහපත්ව පවත්වාගෙන යාමට සනීපාරක්ෂාව, ස්වස්ථතාව හා වෛද්‍ය ක්‍රමය මැනවින් සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. (ල. 6)

4. i. පැරණි ශ්‍රී ලංකාවේ රජරට ශිෂ්ටාචාරයේ දැකිය හැකි ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන තුනක් දක්වන්න. (ල.3)

ii. කාලිංග මාඝගේ ආක්‍රමණයත් සමඟ පහත සඳහන් ස්ථානවල බලකොටු ගොඩනගා ගනිමින් ඒ ප්‍රදේශයන් ආරක්ෂා කළ පුද්ගලයින් පිළිවෙළින් සඳහන් කරන්න.

A - දඹදෙණිය B - යාපහුව

C - ගංදෙණිය(මිණිපේ) D - ගෝවින්ද මළය (ල.4)

iii. දඹදෙණි රාජධානියට වැදගත් වැදගත් කමක් ලබා දුන් රජවරුන් දෙදෙනා නම් කර ඔවුන් කළ සේවාවන් කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

iV. දෙවන නාගරීකරණයේ දැකගත හැකි දේශීය හා විදේශීය ආර්ථික රටාව ගොඩනැගී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

5. i. A - මහනුවර රාජධානිය ආරම්භ කළ පාලකයා නම් කරන්න.

B - විජයබා කොල්ලයේ දී මායාදුන්නේ රජුට උදව් කළ උඩරට පාලකයා නම් කරන්න.

C - පළමුවන රාජසිංහ රජුට උඩරට රාජධානිය සීතාවකට යටත් කර ගැනීමට උදව් කළ උඩරට ප්‍රභූවරයා කවුරුන් ද? (ල. 3)

ii. මහනුවර රාජධානියේ ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගෙන කොටස් කිහිපයකට බෙදී තිබුණි. ඉන් හතරක් නම් කරන්න. (ල. 4)



CamScanner

iii. දෙවන රාජසිංහ රජු උඩරට රාජධානිය, පෘතුගීසීන්ගෙන් හා ලන්දේසීන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 5)

iV. 1803 වර්ෂයේ මැක්ඩොවෙල්ගේ නායකත්වයෙන් උඩරටට එල්ල වූ ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

6. i. A - ඉන්දියාවේ මුගල් අධිරාජයා වූ ජහන්ගීර් සමඟ වෙළඳ කටයුතු පිළිබඳ සාකච්ඡා කළ ඉංග්‍රීසි ජාතිකයා,

B - 1623 වර්ෂයේ ලන්දේසීන් පහරදුන් ඉංග්‍රීසීන්ට අයත් කුළුබඩු දිවයින ,

C - ඉංග්‍රීසීන්ට අයත් ඉන්දියාවේ බටහිර වෙරළෙහි ඉදිකළ බලකොටුව, පිළිවෙලින් සඳහන් කරන්න. (ල.3)

ii. පහත ප්‍රකාශවලට ගැළපෙන නිවැරදි පිළිතුරු පිළිවෙළින් සඳහන් කරන්න.

A - වෙළඳ සබඳතා ඇති කර ගැනීමට ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා,

B - ශ්‍රී ලංකාවේ සිටි අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා,

C - ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා,

D - ප්‍රංශය ඕලන්දය ආක්‍රමණය කරන විට බ්‍රිතාන්‍යයට පලා ගිය ඕලන්ද පාලකයා, (ල. 4)

iii. 1818 වර්ෂයේ බ්‍රිතාන්‍යයට එරෙහිව පැන නැගුණු ප්‍රථම නිදහස් අරගලය අසාර්ථක වීමට හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 5)

iV. 1848 වර්ෂයේ දෙවන නිදහස් අරගලයට බලපෑ හේතු තුනක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

7. i. 1978 වර්ෂයේ හඳුන්වා දුන් ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුව සතු බලතල තුනක් සඳහන් කරන්න. (ල. 3)

ii. 1972 වර්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 4)

iii. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් මෙරට ආර්ථික සංවර්ධනය ඇති කිරීමට දායක වී ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 5)

iV. නිදහසින්පසු ශ්‍රී ලංකාවේ,

A - සුළු අපනයන භෝග වගාව,

B - ව්‍යාපාරික කෘෂිකර්මාන්තය ඉහළ නැංවීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

## 111 කොටස

8. i. පුනරුද යුගය යුරෝපයේ විවිධ අංශවල වෙනස්කම් ඇති කිරීමට සමත් විය.

A - පුනරුදයේ නව චිත්‍ර කලාවක් බිහිකළ ඉතාලියේ ප්‍රසිද්ධ ප්‍රදේශය නම් කරන්න. (ල. 1)

B - පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පය මැනවින් පිළිබිඹු කරන රෝමයේ ඇති ගොඩනැගිලි දෙකක් සඳහන් කරන්න. (ල. 2)

ii. පුනරුද යුගයේ සිටි ලියනාඩෝ ඩාවින්චි, චිත්‍ර ශිල්පය හැර, දක්ෂතා දැක් වූ වෙනත් ක්ෂේත්‍ර හතරක් නම් කරන්න. (ල. 4)



CamScanner

ii. යුරෝපයේ පුනරුදය ඇති විමට බලපෑ හේතු දෙකක් දක්වා උදාහරණ සහිතව විස්තර කරන්න.

(ල. 5)

V. පුනරුදය ශ්‍රී ලංකාවට බලපෑ ආකාරය,

A - දේශපාලනික

B - ආර්ථික

C - සමාජ සංස්කෘතික අංශයන්හි ඇති කළ වෙනස්කම්, එක් කරුණ බැගින් ලියා දක්වා විස්තර කරන්න.

(ල. 6)

i. A - පළමුවන ලෝක යුධ සමයේ ජර්මනියේ සිටි අධිරාජ්‍යාවරුන් දෙදෙනෙකු හා,

B - දෙවන ලෝක යුධ සමයේ ජර්මනියේ සිටි අධිරාජ්‍යයා නම් කරන්න.

(ල. 3)

ජාතීන්ගේ සංගමය පිහිටු වීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල. 4)

. පළමුවන හා දෙවන ලෝක යුධ තත්ත්වයන්, අදටත් මිනිසාට අහිතකර බලපෑම් ඇති කරන කරුණු දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 5)

/. පහත සඳහන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතන මඟින් තම අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන කාර්යයන් කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

A - මහාමණ්ඩලය

B - ආර්ථික හා සමාජීය මණ්ඩලය

C - ආරක්ෂක මණ්ඩලය (ල. 6)

**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ඉතිහාසය - 11 ශ්‍රේණිය - 2024(2025)**

**පිළිතුරු පත්‍රය**

---

**1 පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| 01. 3 | 11. 4 | 21. 4 | 31. 4 | |
| 02. 1 | 12. 1 | 22. 3 | 32. 4 | |
| 03. 4 | 13. 2 | 23. 2 | 33. 2 | |
| 04. 2 | 14. 3 | 24. 1 | 34. 3 | |
| 05. 3 | 15. 2 | 25. 1 | 35. 1 | |
| 06. 2 | 16. 1 | 26. 2 | 36. 3 | |
| 07. 1 | 17. 1 | 27. 3 | 37. 1 | |
| 08. 4 | 18. 4 | 28. 4 | 38. 2 | |
| 09. 3 | 19. 2 | 29. 3 | 39. 4 | |
| 10. 3 | 20. 3 | 30. 2 | 40. 3 | (ල. 2 x 40 = 80) |

(ආ) (i)

A - සින්නාරුබිම් බුදල්නා

B - අල්බලසූරිය

C - පොන්නම්බලම් ආරුණාචලම් මහතා

D - ජෝර්ජ් ග්‍රැන්විල් (ල. 4)

A 1. ශිලා සම්ප්‍රදායට අයත් සුසාන

2. පූර්ව ඓතිහාසික යුගය

3. කලු ගල්

4. ප්‍රභූන්

(ල. 4)

B 1. වී. අයි. ලෙනින්

2. රුසියාව

3. රුසියන් විප්ලවය

4. සමාජවාදී දර්ශනය (ල. 4)

**11 කොටස**

2. i. A - ගල් යුගය (ප්‍රාග් ඓතිහාසික යුගය)/ ශාක ආහාරමත යැපීම වෙත වැඩි නැඹුරුවක් දැක්වීම හා

ලෝහ භාවිතය, ස්ථිර ජනාවාස ආරම්භය (පූර්ව ඓතිහාසික යුගය) (ල. 2)

B - ඉරණමඩු සැකැස්ම (ල. 1)

ii.

A - අමුණ B - අනුරාධපුරය

C - ආරක්ෂිත ගම් D - ගමත් පුරයත් අතර වූ ජනාවාස (ල. 5)

iii. කෘෂිකාර්මික රටාවක් - යකඩ මෙලම් හමුවීම

මැටි තාක්ෂණයක් - පින්තාරු කළ මැටි බඳුන/ මැටි පබළුව

iV. - ප්‍රධාන නගර මුල්කරගෙන වෙළෙඳාම සිදුවීම. (අනුරාධපුර/ මාගම)
- විවිධ භාණ්ඩ වෙළෙඳාම් කිරීම. (අබල වපර/ බුලත්/ )
-වෙළෙන්දන් සමූහ වශයෙන් සංවිධාන වී සිටීම.(පූගය/ නියමස්ථාන)
- වණිජ හා වාපර නම්වලින් හඳුන්වා තිබීම
........................................................ ආදී (ල. 6)

3. i. වැව් තැනීම/අමුණු හා ඇළ මාර්ග/ පොකුණු / ජල උද්‍යාන (ල. 3)

ii. A - ඇළහැර ඇළ/තල්වතු ඇළ B - යෝධ ඇළ

C - අංගමැඩිල්ල ඇළ D - රිදී බැඳි ඇළ (ල. 4)

iii. වජ්‍රවුම්බටය යොදා ගැනීම හා අත්තිවාරම සෑදීම (ල. 5)

iV. - විවිධ රජවරුන් රෝහල් ඉදි කිරිම

- වෛද්‍ය උපකරණ හමුවීම (ආලාහන පිරිවෙනින් හමුවන ලෝහ කතුරු)

- ආරෝග්‍යශාලාවල නටඹුන් හමුවීම(ආලාහන පිරිවෙන )

- ......................................................................................... (ල. 6)

4. i. අනුරාධපුර/ මාගම/ පොළොන්නරුව (ල.3)

ii. A – 111 විජයබාහු රජු B - සුභ සෙනෙවි

C - සංඛ සෙනෙවි D - බුවනෙකබාහු ආදිපාද (ල.4)

iii. තුන්වන විජයබාහු රජු හා දෙවන පරාක්‍රමබාහු රජු කල සේවය විස්තර කර තිබීම. (ල.5)

iV. දේශීය - කෘෂි ආර්ථික රටාවක් දක්නට තිබීම(වී හා හේන් වගාව)/
විදේශීය - අතිරික්තය වෙළෙඳාම සඳහා යොමු කිරීම / විදේශ රටවල් සමඟ වෙළෙඳ සබඳතා පැවතීම
විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය යටතේ තිබීම
........................................................................... (ල. 6)

5. i. A - සේනාසම්මත වික්‍රමබාහු රජු .

B - ජයවීර බණ්ඩාර රජු

C - පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාර (ල. 3)

ii. ගබඩාගම/ නින්දගම්/ විහාරගම්/දේවාලගම් /පරවේණිගම් (ල. 4)

iii. පෘතුගීසීන්ගෙන් - රන්දෙණිවෙල හා ගන්නෝරුව සටන්

ලන්දේසීන්ගෙන් - 1670- 1675 කාලයේ දෙවන රාජසිංහ රජු එල්ල කළ ප්‍රහාර (ල. 5)

iV. - රජුගේ උපායශීලීත්වය (නගරය අතහැර ගොස් වැසි සමය එළඹෙන තෙක් ඔවුන් රඳවා ගැනීම)

- මහනුවර කොළඹ මාර්ගව අවහිර කිරීම

- රෝග පීඩා ඇති වීම

- .......................... ආදී (ල. 6)

6. i. A - විලියම් හොකින්ස්

B - ඇම්බොයිනා දූපත

C - මදුරාසිය (චෙන්නායි ) (ල.3)

ii.

A - ජෝන් පයිබස්

B - ෆන් එංගල් බෙක්

C - ෆෙඩ්රික් නෝර්ත්

D - පස්වන විලියම් රජු (ල. 4)

iii. - ඉංග්‍රීසීන් අනුගමනය කළ දැඩි මර්දනකාරී ප්‍රතිපත්ති.

- දීර්ඝ කාලීන සටනකට අවශ්‍ය අවි ආයුධ හෝ වෙනත් සම්පත් උඩරැටියන්ට නොතිබීම.

- සටනේ අසංවිධානාත්මක බව

- රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තාට නියම රාජ්‍ය උරුමයක් නැති බව හෙළි වීම. (ල. 5)

iV. - රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

- ගම් සභාව අඩපණ වීම
- නව අධිකරණ ක්‍රමය
- රජය හා මහජනතාව අතර පරතරය දුරස් වීම.
- ටොරින්ටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්ති (ල. 6)

7. i. නීති පැනවීම/ මුදල් පරිපාලනය/ අයවැය සකස් කිරීම/ සංවර්ධන සැළසුම් සම්පාදනය (ල. 3)

ii. ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

ශ්‍රී ලංකාව යන නාමයෙන් මෙරට හැඳින්වීම

බ්‍රිතාන්‍ය රජය සමඟ පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම

ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් බව පිළිගැනීම...................... ආදී (ල. 4)

iii. 11 ශ්‍රේණියේ පිටු අංක 100 (ල. 5)

iV. A – 11 ශ්‍රේණියේ පිටු අංක 105

B - 11 ශ්‍රේණියේ පිටු අංක 104/105 (ල. 6)

**111 කොටස**

8. i. A - ෆ්ලෝරන්ස් නගරය (ල. 1)

B - ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය/ ආසන දෙව්මැදුර (ල. 2)

ii. කවියෙක්/ සංගීතඥයෙක්/ විද්‍යාඥයෙක්/ ප්‍රායෝගික ඉංජිනේරුවරයෙක් (ල. 4)

iii. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීම
වෙළෙඳාම දියුණුවීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම
බුද්ධි ප්‍රබෝදය
පල්ලියේ ආදිපත්‍ය විවේචනය වීම (ල. 5)

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

iV. A - 10 ශ්‍රේණියේ පිටු අංක 123/ 124

B - 10 ශ්‍රේණියේ පිටු අංක 123/ 124

C - 10 ශ්‍රේණියේ පිටු අංක 123/ 124 (ල. 6)

9. i. A - ඔටෝවොන් බිස්මාර්ක් /දෙවන විලියම්

B - ඇඩෝල්ෆ් හිට්ලර් (ල.3)

ii. රටවල් අතර ඇතිවන වාදබේද සාමකාමීව විසදීම
අනාගතයේ ලෝක යුද්ධ ඇතිවීම වැළැක්වීම
ජාත්‍යන්තර අවබෝධය හා සහයෝගය ගොඩනැගීම
කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
විශ්ව සාමූහිකත්වය මගින් ලෝක සාමය සුරක්ෂිත කිරීම (ල. 4)

iii. විවිධ ලෙඩ රෝග ව්‍යාප්ත වීම (පිළිකා/ චර්ම රෝග)

අංග විකල දරුවන් බිහිවීම

ජෛව විවිධත්නයට හානි සිදුවීම

අධික අවි ආයුධ යොදා ගත් නිසා පරිසරය උණුසුම් වීම

අහිතකර වායු වර්ග පරිසරයට මුදා හැරීම නිසා ජීවීන්ගේ ආයු කාලය කෙටි වීම.

සාගරයට ඇති කරන ලද බලපෑම්

ආර්ථික අර්බුද ඇතිවීම (ල. 5)

iV. 11 ශ්‍රේණිය පොතේ පිටු අංක 155/ 156/ 157 (ල. 6)

WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න